# 2025 වර්ෂය.

## ප්‍රසම්පාදන දැන්වීමයි.

## කිරම බස් නැවතුම්පොළ බිම් මහල අංක 10 නව කඩ කාමරය බදු දීම.

## කටුවන ප්‍රාදේශීය සභාව.

කටුවන ප්‍රාදේශීය සභාවට අයත් කිරම බස් නැවතුම්පොළ බිම් මහලේ පිහිටි අංක 10 නව කඩ කාමරය බදු දීම සඳහා ප්‍රසම්පාදන පත් කැඳවනු ලැබේ.

2025.06.23 දින පෙ.ව. 8.30 සිට 2025.07.07 දින ප.ව. 2.00 දක්වා ප්‍රසම්පාදන පෝරම නිකුත් කරන අතර තම ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් හා තම අනායනතාවය හා ස්ථිර පදිංචිය සනාථ කිරීමට අදාළ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කර කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවනට පමණක් පහතින් දැක්වෙන ගාස්තු ගෙවා ප්‍රසම්පාදන පෝරම මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන පෝරම සම්පූර්ණ කර මුල් පිටපත හා අනුපිටපත ලෙස වෙන වෙනම කවර දෙකක බහා මුද්‍රා තබා එම කවරවල මුල්පිටපත හා අනුපිටපත යන්න සඳහන් කර එම මුද්‍රා තබන ලද කවර දෙකම එකම කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවර **" කිරම බස් නැවතුම්පොළ බිම් මහලේ පිහිටි අංක 10 නව කඩ කාමරය සඳහා ප්‍රසම්පාදනය"** යන්න සඳහන් කර 2025.07.08 වන දින පෙ.ව.10.00 ට පෙර මිද්දෙනිය කටුවන ප්‍රාදේශීය සභාවේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමට හෝ එදින නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ හැකිය.

2025.07.08 වන දින පෙ.ව.10.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.ටෙන්ඩර්පත් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කටුවන ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර් කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

වැඩි විස්තර දුරකථන අංක 047 2247275 මඟින් මෙම කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළ දී ලබා ගත හැකි වේ.

| කඩ කාමර අංකය | මාසික බදු කුලිය (රු) | අවමලංසුව (එක්වන් මුදල) (රු) | ටෙන්ඩර් ඇප තැන්පතුව (ආපසු ගෙවන) (රු) | ටෙන්ඩර් පෝරම ගාස්තුව (ආපසු නොගෙවන) (රු) |
|---|---|---|---|---|
| 10 | 4,500.00 | 450,000.00 | 20,000.00 | 2,000.00 |

සී.එන්.ජයසේකර
ලේකම්
කටුවන ප්‍රාදේශීය සභාව
මිද්දෙණිය